(c) www.sinhalalyrics.com

මහ මෙවුනාවේ සමාධි බුදු ඇස
රෑ වට සීතල පින්නෙන් පිරුණිද
නැතිනම් සැබැවින් කඳුළින් වැසුනිද

පිරිතේ තෙවලා බණ පදයේ
සාදු කරයේ හඬ මඩිමින්
අවි ගැටෙනා හඬ රණ දෙරණේ
දෝංකාර දී එයි නැගෙමින්
ඒ ඇසූ බුදු ඇස කඳුළින් වැසුනිද
නැතිනම් රෑ වට පින්නෙන් පිරුණිද

හදේ ගලාගිය මෙත් ගඟුලේ
සීතල දිය රැළි ගල් ගැසෙමින්
නොමිනිස්කම් දළු දමා වැඩේ
මිනිසත් භාවය ගිනි තබමින්
ඒ දුටු බුදු ඇස කඳුළින් වැසුනිද
නැතිනම් රෑ වට පින්නෙන් පිරුණිද

පද රචනය - සුනිල් ආරියරත්න
සංගීතය - රෝහණ වීරසිංහ